# අනන්තය



## ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න

ධනේශවර සමාජය මිනිසුන් බෙදා විසිරුවා හරිනවා. තරුණයන් සමාජ ගත වෙන්නේ පවුලෙන් ඉවත් වෙලා ක්‍රීඩාවෙන්, බීම හලෙන්, මිත්‍ර කල්ලිවලින් රංචු ගැසිලයි. පිරිමියෙක් මේ වගේ තම අවට සමාජයේ කල්ලි පැවැත්මකට පුරුදු වුණොත් එකෙන් කැඩෙන්න සූදානම් නැහැ. තරුණ විය ඉවත් වෙනකල්ම රංචු ගැසී එදිනෙදා දිවිය ගෙවන තැනට පත් වෙනවා. විශේෂයෙන්ම නිර්ධන සමාජය මේ විදියට තරුණයාට තාවකාලික සමූහ පැවැත්මක් හදල දෙනව. ඒත් ගැහැණිය එයට වෙනස්. ඇය තම රංචු පැවැත්ම ඉකමණින් ඉවත් කරල විවාහය ගැන නැත්නම් පවුල්වීම ගැන හිතනව. විශේෂයෙන් යුරෝපයේ නැත්නම් දියුණු කාර්මික ලෝකයෙම තරුණ සමාජය මේ විදියට ගැටළුවක් තුළයි පවතින්නේ.

තරුණියන් තරුණයින් එකිනෙකා හමුවෙන්නේ විවිධ ලෙසටයි. බොහෝ වෙලාවට ආගන්තුකයින් ලෙසට යම් එකතුවකදී හමු වෙන්න පුළුවන්. නැත්නම් පාර තොටේ වෙන්න පුළුවන්. මේ අහම්බ හමුවීම තුළදී සමහර විට තමන්ට ඉතාම ගැලපෙන තැනැත්තා හැටියට හිතෙන තැනැත්තා මුණ ගැහෙන්න පුළුවන්. මොකද? නූතන මනෝ විද්‍යාඥයන් කියන විදියට අපි හැමෝම අපේ පුංචි කාලේ පවුල තුළින් ගොඩනැගුන පවුල පිළිබඳ හැඟීම් හිසේ දරාගෙන ඉන්නේ. අර ගොළුබෙල්ලෝ නිවස කරේ තියාගෙන ඇවිදිනව වගේ හිත තුළ අපි නිවසත් තියාගෙන ඉන්නේ. ඒ නිසා හැඟීම් තුළින් ගැලපෙන කෙනාට තදින්ම ඇදිල යනව. විශේෂයෙන්ම කාන්තාව ඒ විදියට තෝරාගැනීමක් කළොත් එය පිරිමියාටත් ආරෝපනය කරනව. සමහර විට මේ හැඟීම ආවත් එවෙලේ ඇති තමන්ගේ බැඳුම් නිසා, ඒ ප්‍රේම සම්බන්ධතාවය අත්හැරල දමනව. කැපකිරීම් කරන්නේ නෑ. ඒත් පසුකාලීනව තමන්ට තේරෙනවා ඒ බැඳීම පතුළටම ගිය එකක් බව. ඒත් දෙන්නා දෙපැත්තට ගිහින් වෙළඳ සමාජය තුළ නැතිවෙලා. හොයන්න අමාරුයි. හෙව්වත් ඒ අය අද ඉන්න බැඳුම් ඉවත් කරල ආදරය යළි පටන් ගන්න බෑ.

මෙන්න මේ ගැටළු ගැන ඉතාම අපූරු විදියට පෙන්වා දීමක් හොරේස් හොව්මාන්ගේ "හිස් අවකාශය පුටුව අරන්" නාට්‍යයෙන් කෙරෙනව කියලයි මට පෙනුනේ. මේ ජර්මන් නාට්‍යය සිංහලෙන් පණගන්වන්නට සෆීර්ගේ නූතනවාදී නාට්‍ය කණ්ඩායම පියවර අරන්. ඒ නාට්‍යය අළුත් හැඩයකටයි ඉදිරිපත් වෙන්නේ. මං මීට ඉස්සෙල්ලා කිව්ව වගේ ඒක අපිට ඒ තරම් අළුත් නෑ. ගොයම් කපපු කාලෙට කමත වටේ වාඩි වෙලා අපි කෝලම් බලනව ගමේ නාට්‍යකාරයාගේ. කුවේණිගේ කථාව නැත්නම් සොකරි නැටුම වුණත් එකම පුද්ගලයා ඉදිරිපත් කරන වෙලාවන් තියෙනව. සාමාන්‍ය වේදිකා ක්‍රමය ඉංග්‍රීසි වික්ටෝරියානු සම්ප්‍රදායෙන් ලංකාවට ගොඩබැස්ස දෙයක් හැටියටයි මට නම් හිතෙන්නේ. නැත්නම් වටේට වාඩි වෙලා මැද්දෙ රංගනයට තමා අපි පුරුදු. පේරාදෙණියේ "වල" තුළ නාට්‍ය පෙන්වන්නේ ඒ පරණ විදියටමයි. වල වටේට වාඩි වෙලා අපි මනමේ බැලුවෙත්.

***නූතන මනෝ විද්‍යාඥයන් කියන විදියට අපි හැමෝම අපේ පුංචි කාලේ පවුල තුළින් ගොඩනැගුන පවුල පිළිබඳ හැඟීම් හිසේ දරාගෙන ඉන්නේ. අර ගොළුබෙල්ලෝ නිවස කරේ තියාගෙන ඇවිදිනව වගේ හිත තුළ අපි නිවසත් තියාගෙන ඉන්නේ. ඒ නිසා හැඟීම් තුළින් ගැලපෙන කෙනාට තදින්ම ඇදිල යනව.***

මේ නාට්‍යය කෝලමක් හැටියට බලල හිනා වෙන්න පුළුවන්. නළුවා හා නිළිය හැම වෙලේම රස මතු කරමින් ඉන්න ඕනෑ. මොකද? හැම දෙයම ඒ ඇත්තෝ මවල පෙන්වන්න ඕන නිසා. ඒක ලොකු අභියෝගයක්. නාලකත්, නසීනත් එම අභියෝගය ජයගත්ත කියල සතුටු වෙන්න පුළුවන්. මොකද? මට ඈනුම් ගියේවත් නිදි ගති ඇති වුණේවත් නැති නිසා. අනෙක් අතට මං ඉස්සෙල්ලා කියපු විදියට ගැඹුරු ප්‍රශ්නයකටත් අපිව මේ නාට්‍ය තුලින් යොමු කරනව. ලෝකයම ගමක් වුණාට ගමක තිබෙන ආදරණීය බැඳීම් ගෝලීය ධනවාදය තුලින් ලැබෙන්නේ නෑ. මිනිසා වෙළඳ සමාජය තුළ අසරණ වෙලා. විගලිත වෙලා. මිනිස් බැඳීම් විශ්වාස නෑ. හැම දෙයක් ගැනම සැක කළ යුතුයි. නාලක මේ විගලිත වූ තරුණයා ලස්සනට පෙන්නුවා කියලයි මට හිතුනේ. විගලිත වූ නිසාම තමාගේ මොහොතේ වාඩිලා ගත් තැන හරි වැදගත්. එය පාවා දෙන්න හිලව්වක් අවශ්‍යයි. ඔහු ඒ බව තරයේ අවධාරණය කරනවා.

නසීනා ගෙදරින් පිටවී ඇවිත් පවුලකට සැලැස්ම දමමින් ඇවිදින්නියක්. ඒකට ලගින්න කෙනෙක් හා තැනක් අවශ්‍යයි. ඒත් ඒ තමන්ගේ රාමුව අනුවයි. ඇයගේ ඉල්ලීම් සරලයි. හැබැයි තදයි. තරුණයා ගැලපෙන්නත් ඕනෑ. මේ විදියට බැලුවොත් මේක ගැඹුරු නාට්‍යයක්.

මේක දිගට පෙන්වන්නේ නැහැ කියල කිව්වහම මට තෝන්තුවාවක් වගේ දැනුන.

*From page 4 ( The world...)*

possess a moral sense. In the research, US scientists found that these animals appeared to have a conscience; that they could recall obligations, and make judgements about fairness; and that they could empathise with troubled fellow animals. All this suggest a sense of morality.

Darwin had pointed out that animals could adopt patterns of behaviour that went on to be encoded in their genes.

The opposition to Darwin is fizzling out. Creationists are, however, still undaunted and are trying to find gaps in the Darwinian explanation. "But gaps shrink as science advances and God is threatened with eventually having nothing to do."(Dawkins)

Mobile Pet Vet

Let the Vet come to you

AFFORDABLE
QUALITY VETERINARY CARE
AT YOUR HOME

Services Include:
Consultation and treatment
Vaccination C5 C3 F3 Heart worm and rabbit vac
Deworming and Declawing
Microchipping
Euthanasia

Surgery is arranged at the clinic



10% discounts for pensioners and multiple pet owners

For appointments telephone
Dr. Sudharma Gamage BVSc
0433 49 21 21

Servicing South Eastern Suburbs

## පත්තර මිත්තරයාගේ



පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ඉදිකිරීමට එරෙහිව උද්ඝෝෂණ ව්‍යාපාරයක් - ලක්බිම

*ඉන්දියාව රුසියාව ඕස්ට්‍රේලියාව මේ උද්ඝෝෂණයට ෆුල් සපෝට්. මල්ලිලා මහන්සි වෙලා කොහොම හරි පෞද්ගලික විශ්ව විද්‍යාල හදන එක නවත්තන්ඩ ඕනෙ. එතකොට දැන් සිද්ද වෙනවා වගේ නිර්ධන පන්තියේ දූ දරුවන්ට පුලුවන්නෙ මේ රටවලට ඇවිත් උපාධි අරගෙන යන්න.*

මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට වැරදි කරුවන් වූ දෙදෙනෙකුට ජනාධිපති සමාව - දි අයිලන්ඩ්

*මතට නිත*

බස්නාහිර එජාප අපේක්ෂකයෝ 24 වන දා වත්කම් හෙළි කරති - දිවයින

*විපක්ෂෙ ඉන්නකල් අනේ හරිම නීතිගරුක හොඳ කාණ්ඩෙ*

කොතලාවල පවුලේ විදේශ වත්කම් ගැන පරීක්ෂණ - රිවිර ඉරිදා සංග්‍රහය

*ෆාස්ට් කෑෂ් හොයන්න ගිහින් කර ගත්ත දේ*

බස්නාහිර ඡන්ද සටනේ කලුතර නිල් කොළ හා රතු මනාප සටන උණුසුම් - රිවිර ඉරිදා සංග්‍රහය

*බලන්ඩකෝ ඉතින් රටට සේවය කරන්න තියෙන ඕනෙකම*

ඒ කාලේ මම කැමැත්තෙන් හිටියේ හමුදාවට බැඳෙන්න - නිරංජලා
රිවිර

*දැන්නම් හැමෝම කැමතියි*

'මං නායකත්වය අතහරින්න සූදානම්': රනිල් - ලංකා ඊ නිව්ස්

*දැන් නම් අල්ලගෙන හිටියත් වැඩක් වෙන්නෙ නැහැ මහත්තයෝ*

අන්තිම මොහොතේත කොටි කලු කඩයක් අරිති - ලංකාදීප

*ඔන්න ඔහෙ කමක් නෑ ඉතිං අනාගතේ කරන්ඩ රස්සාවක් තියෙන්ඩත් ඕනෙනෙ*

පක්ෂය ශක්තිමත් කිරීමේ මත අරගලය අවසන් - එජාප මහ ලේකම් තිස්ස අත්තනායක (රනිල් නැවත නායකත්වයට පත් කර ගැනීමෙන් පසු) - දිවයින

*විලි ලැජ්ජාව නැති කම මහ ලේකම් කමටත් වඩා ලොකුයි කිව්වලු*

පාස්පෝට් කන්තෝරුවට අලුත් නමක් එයි
ලංකාදීප

*අලුත් බෝතලේ පරණ වයින්*

හිටපු මහේස්ත්‍රාත් හිරේට - ලංකාදීප

*එතුමිය ආචාර්ය මර්වින්ගෙන් ඇහුවා නම් නඩු වලින් බේරෙන හැටි ඉගෙන ගන්න තිබ්බනෙ*